# වඳුරන්ගේ සැඟවුන බලය



**ගසින් ගසට පනිමින් ජීවත්වන වඳුරා සිංහල අපිට ආගන්තුක නැත. මිනිසාගේ සම්භවයට පවා නෑකම් කියන වඳුරා තුළ වූ හුරුව විටෙක බෙහෙවින් විනෝදජනක ය. ජපන් බසින් සරු (Zareru) නමින් වඳුරා හඳුන්වන්නේ මෙම සත්ව විශේෂය තුළ වූ මිනිසුන් විනෝද කිරීමේ ගුණය නිසාය.**

ජපනායට ආවේනික වූ කැළෑ වඳුරන් අතර (Nihon – Zaru Macaca genus ප්‍රභේදය විශේෂ තැනක් ගනී. වඳුරන්ගේ වෙනස් නොවෙන ගති පැවතුම් පිළිබඳව ජපන් ජනතාව තුළ වූ දැනුම සහ අත්දැකීම් අති මහත් ය.

බටහිර රටවල වඳුරන් බොහෝවිට බැබුන් ට සමානය. බල්ලෙකුට සමාන මුහුණක් ඇති මෙම වඳුරන් තැනිතලා ප්‍රදේශවල ජීවත් වෙති. ආදි ඊජිප්තු වාසීන් බැබුන් දෙවියකු ලෙසින් සලකන ලදී. පෙරදිග සහ අපරදිග වඳුරු කුල අතර මෙම පැහැදිලි වෙනස දක්නට ලැබේ.

බටහිර රටවල් අතර වූ විශ්වාසය අනුව වඳුරන් මිනිසා තුළ සැඟව සිටින යක්ෂයන් ලෙසින්ද තවත් විටෙක වඳුරා ගරු කටයුතු දේවත්වයෙන්ද සලකන ලදී. හින්දු ආගමික විශ්වාසයන්ට අනුව "හනුමා" නමින් හඳුන්වන ලද අසාමාන්‍ය වීර චරිතය තුළ ඇත්තේ ද වඳුරෙකු බව පෙරදිග ජනශ්‍රැතිය හොඳින් දන්නා හඳුනන අපට අමුත්තක් නොවේ. චීන ජනශ්‍රැතිය තුළ ඇති විශ්වාසයන්ට අනුව වඳුරාගේ අත් සහ වලිගය බුද්ධියෙන් සහ දක්ෂතාවයන්ගෙන් පිරී ඇත.

චීනය තුළ වූ විශ්වාසයන්ට අනුව වඳුරකු සිටින ස්ථානයකදී අශ්වයන් ලෙඩ වන්නේ නැත. පසුකලෙක මේ අදහස ජපානයටද ව්‍යාප්ත විය. වඳුරන් තුළ සැඟවුන බලයක් ඇතැයි යන්නට හොඳම නිදර්ශන අවස්ථාවන් මේවා බව දැන් ඔබට තහවුරු වෙනවා නොවේ ද ?

චීන දින දර්ශනය මූලිකාංග දෙකකට බෙද ඇත. ඒවා සතුන් 12 ක ගෙන්ද ද්‍රව්‍ය 10 කින්ද යුක්තයි. එක චක්‍රයකට ඒකක 60 ක් අයිතිව තිබුනි. නිර්මාණය කරන ලද එක් දිනක් දින දර්ශනයේ දින 60 ක් අයිතිය ගනී. මේඅතර වඳුරන්ට වෙන් වුන දිනයක් ද නම් කිරීමට චීන චාරිත්‍ර විසින් අමතක කලේ නැත.

දීර්ඝායුෂ ලබා ගැනීමට දේවත්වයෙහි ලා සලකන වඳුරන්(Sanno Gongen)වෙනුවෙන් රාත්‍රිය පුරාම යාඥා කිරීමේ සිරිත ජපානයේ ව්‍යාප්තව ඇත.

අයහපත් දේ නොබලන්න.... නොකියන්න.... නැංයන්න යන අදහස මූර්තිමත් කරන ඇස්/ කට/ කන් වසාගත් වඳුරන්ගේ ආකෘති තුන ජපානයේ සම්භවය ලැබුවද අද ලෝකය පුරාම ව්‍යාප්තව ඇත.

වඳුරන් මුල් කර ගෙන ගෙතුන රසවත් ජපන් ළමා කථා රාශියකි.The Battle of the Monkey and the Crabඒ අතරින් එකකි. කකුළුවෙකු ඒ වටා ගෙන පලතුරු ලබා ගත් වඳුරාගේ කතා පුවත තුළින් උත්සාහ කළේ දරුවන් ලබා දීමට සහ හොඳ අස්වැන්නක් ලබා දීමට වඳුරන් තුළ ගුප්ත බලයක් සැඟවී ඇති බවයි.

වඳුරන්ගේ බුද්ධිමත් බව ඉස්මතු කොට දැක්වීමට මේ අන්දමේ ප්‍රබන්ධ රාශියක් ගොඩ නැගී ඇත. කපටි නුවණ යොදා ගෙන වඳුරා සෙසු සතුන් පරදවන නිසා ජපානයේ දරුවන් මෙම ප්‍රබන්ධ කථාවන්ට මහත් සේ රුචියක් දක්වයි.



වඳුරන් වටා ගෙතුන ජපන් ආප්තෝපදේශ අතර Saru no Karaochiruවඳුරු වුනත් ගසින් බිමට වැටිය හැකියි. යන අදහසද ඉංග්‍රීසි බසින් එන වැටෙන්නට පෙරාතුව ආඩම්බරය පැමිණේ යන අදහසද බොහෝ දුරට එක සමාන ය. ඒත් සිංහල අපි වඳුරා හඳුන්වන්නේ "හැට පිරුණත් වඳුරා බිම නොයයි " යන ගාම්භීරත්වයෙන් නොවේ ද ?


**පුන්‍යා චාන්දනී ද සිල්වා**

60 පිටුවෙන්

# න්‍යෂ්ටික ආයුධ ...

අන්තර් ජාතික පරමාණුක ශක්ති ඒජන්සිය පසුගිය සතියේ හෙළිදරව් කළ ආකාරයට මැලේසියානු රජය ප්‍රථම වතාවට ඔවුනට තාහීර් මුණගැස්සීමට එකඟතාව පළ කර ඇත. ඒ ඛාන් ළඟට සිටින ඉතාම වැදගත් තැනැත්තාය.

BBC China නෞකාව අත්අඩංගුවට ගැනීමෙන් දින දෙකකට පසු ඇමෙරිකානු රජයේ උපලේකම්වරයා වන රිචඩ් ආමිටේජ් ඉස්ලාමාබාද් නුවරට පැමිණ මුසාරෆ් හමුවිය. පාකිස්ථානය ඛාන්ගේ න්‍යෂ්ටික අලෙවි ජාලය නතර කළ යුතු බවට දැනුම් දුන්නේය. "මට කවද හරි දඬිය දම්ම නම්... ඒ එද" මුසාරෆ් පසුව පැවසීය. ඛාන්ට ලැදි පාකිස්ථානු ආරංචි මාර්ග පවසන ආකාරයට න්‍යෂ්ටික වැඩ සටහනෙහි නියැලී සිටින විද්‍යාඥයන් තුළ වූ තමන් අත්අඩංගුව පත්වේ දැයි යන බිය පහ කිරීමට මුසාරෆ් ක්‍රියා කර ඇත. විශේෂයෙන් පාකිස්ථානු රජයේ ඉහළ හමුදා නිලධාරීන් ද මෙයට පැටලවීමට ඛාන්ට ඇති අවකාශය සලකා බලා පාකිස්ථානු රජය ක්‍රියා කර ඇත. ඛාන් අවසන් වතාවට මහජනයා ඉදිරියේ



පෙනී සිටියේ 2004 පෙබරවාරි 4 වැනිද එහි ජාතික රූපවාහිනිය ඔස්සේ සිය ජාවාරම පිළිබඳ පාපොච්චාරණය කිරීමටය. ඊට පසු දිනයේ වොෂින්ටනයේ දැඩි කෝපයට හේතුවූවද මුසාරෆ් ඔහුට සමාව ප්‍රදානය කළේය.

ඛාන් පිළිබඳ සොයා බැලීම් සිදුවන්නේ සෙමිනි. පසුගිය දෙසැම්බරයේ දී ධවල මන්දිරයේ දී කෙරුණු සාකච්ඡාවේදී මුසාරෆ් පළ කළේ මේ සියලු වැරදි ඛාන් මතම පැටවිය හැකිදැයි යන්න සිතිය නොහැකි බවයි. ඔහුට විරුද්ධ පරීක්ෂණ පැවැත්විය හැක්කේ ඉදිරිපත් වන සාක්ෂි මත බව ඔහුගේ හැඟීමයි. ඇමෙරිකාව සතුව ඛාන් සම්බන්ධව දැන ගත යුතු සුවිශේෂ කාරණා වේ නම් ඒවා තමාට ඉදිරිපත් කරන ලෙස ඔහු ඉල්ලා සිටියේය. "මං ඒ පිළිබඳ සොයා බලන්නම්" මුසාරෆ් බුෂ්ට සහතික විය. ඇමෙරිකානු රජය ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කර ඇත. ඒවා පාකිස්ථානු රජය මඟින් ඛාන්ට ඉදිරිපත් කර ඉනික්බිති ඇමෙරිකානු රජය වෙත දන්වනු ඇත.

එසේ වුවත් නොවිසඳුණු බොහෝ ගැටලු ඉතිරිව පවතී. ඒ අතර ඛාන් ලිබියාවට න්‍යෂ්ටික යුධ සැලසුම් විකුණු අයුරින්ම ඉරාණයට ද විකුණා ඇත්දැයි යන්න ද වේ. එසේ වන්නේ නම් එය ඉරාණ න්‍යෂ්ටික මධ්‍යස්ථානය මහජන අවශ්‍යතා සඳහා ගොඩනැඟුනක් නොවන බවත්, යුධමය කටයුතු සඳහා භාවිතා වන්නක් බවත් ඔප්පු කිරීමට එය ඇමෙරිකාවට සෑහේ. ඊටත් අමතර පාකිස්ථානයේ ඉස්ලාමාබාද් නුවර පිහිටි ඛාන්ගේ න්‍යෂ්ටික පර්යේෂණ මධ්‍යස්ථානයේ ආරංචි මාර්ග පවසන පරිදි "ලොක්ක එතැනින් ඉවත් කළත් නීත්‍යානුකූල නොවන ජාලය, සැපයුම්කරුවන්, තැරැව්කරුවන් තවම එහෙමම ඉන්නව. කිසිවක් වෙනස් වෙලා නෑ." ඛානිගේ පැරණි මිතුරෙක් පවසන පරිදි "ජාලයට අවශ්‍ය සියලු දඬාංග පවතී. එය නැවතී නැත." මෑතකදී ඛාන්ගේ පර්යේෂණාගාරයේ කරන ලද සෝදිසි කිරීම්වලදී පෙනී ගොස් ඇත්තේ යුරේනියම් ප්‍රතිපෝෂකයක් වශයෙන් අත්‍යවශ්‍ය යුරේනියම් හෙක්ස්ෆ්ලූරොයිඩ් ගෑස් සිලින්ඩර් 16 ක් අතුරුදහන්ව ඇති බවයි. එමෙන්ම තවත් සිත රිදවන සිදුවීමක් වන්නේ ස්විස් සහ ජර්මන් රජයන් පවා ඛාන්ට සම්බන්ධ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට තවම අපොහොසත්ව තිබීමය.

වරෙක ලෝකය පුරා සංචාරය කළ ඛාන් දැන් ප්‍රශ්නාවලීන්ට පිළිතුරු සපයමින් ඉස්ලාමාබාද් නුවර මැදුරකට සිරගත වී සිටී. ඔහුගේ සමීප සගයෙකු පවසන පරිදි ඛාන්ගේ ශරීර සෞඛ්‍යය ද පිරිහෙමින් පවතී. ඔහු මහත් පීඩනයකට පාත්‍රව ඇත. කෙසේ නමුත් මේ මිනිසා පිළිබඳ සටහන ඉතිහාසයේ වියැකී ගියා වුවත් ඉතිහාසයට ඔහුගෙන් උරුමවය ඇති දෑ රැගෙන යන්නේ කොහාට ද යන්න ගැන ලෝකය සිතන්නට පටන් ගත්තා පමණී. තවමත් න්‍යෂ්ටික වෙළෙඳ පොළ සරුසාරවත් එකකි. සිදුව ඇත්තේ එහි ප්‍රධානයාගේ තනතුර හිස්වීම පමණකි.

TIME **ඇසුරෙනි.**